"නිරසාර සංවර්ධනයට සමුපකාරය"
"நிலையான அபிவிருத்திக்கு கூட்டுறவு"
"Co-operative for Sustainble Development"

ඌව පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

உவா மாகாண கூட்டுறவு அபிவிருத்தி திணைக்களம்

DEPARTMENT OF CO-OPERATIVE DEVELOPMENT- UVA PROVINCE

අංක 199, කැප්පෙට්පොල පාර, බදුල්ල.இல 199, கெப்பெட்டிபொல வீதி, பதுளை. NO -199,KEPPETIPOLA ROAD, BADULLA

මගේ අංකය / எனது இல / My No: 6/1/සං/4/ උපදෙස්

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2025.07. 28

සියලුම විවිධ සේවා සමුපකාර සමිතිවල
අධ්‍යක්ෂ මණ්ඩලය වෙත,

<u>ඉන්ධනහල් වල මූල්‍ය අවභාවිතයන් හා මූල්‍ය වංචාවන් පාලනය.</u>

සමුපකාර සමිති මඟින් පවත්වාගෙන යනු ලබන ඉන්ධනහල් වල දෛනිකව ඉහල පිරිවැටුමක් සිදු කරනු ලබයි. මෙම පිරිවැටුම තුළ ඉතා සීමිත ප්‍රමාණයක් රාජ්‍ය ආයතන සඳහා ණය පදනමින් සිදු කලද මුදලට පිරිවැටුම ඉහල අගයක් ගනී. මෙමඟින් ඉන්ධනහල් තුළ නිරන්තරව මුදල් ගැවසීම සිදුවන බැවින් අවභාවිතා කිරීමට හා වංචා කිරීමට වැඩි විභවතාවයක් පවති. පසුගිය කාලයේ ඉන්ධනහල් වල සිදුවූ වංචා හා අවභාවිතා මෙම තත්ත්වය තහවුරු කරයි.

" විවිධ සේවා සමුපකාර සමිතිවල ඉන්ධන අංශය ශක්තිමත් කිරීම" යන මැයෙන් අංක ඉ/ව/2003/1 හා 2003.06.20 දිනැතිව මා විසින් නිකුත් කර ඇති චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි. එමඟින් උපදෙස් ලබාදී ඇති පරිදි ඉන්ධනහල් කළමනාකරණය කිරීමට ස්ථාවර වැඩ පිළිවෙලක් සකස් කල යුතු බව අවධාරණය කරමි.

ඉන්ධන තොග පවත්වාගෙන යාම සඳහා සමිති විසින් විශාල මුදලක් ආයෝජනය කරනු ලබයි. ඇතැම්විට මෙම වටිනාකම රුපියල් මිලියන 10 ක් පමණ වේ. මේ සඳහා අවශ්‍ය මුදල් සපයා ගැනීමේදී බොහෝ විට බැංකු අයිරා පහසුකම්ද යොදා ගනු ලබයි. ඇතැම් සමුපකාර සමිතිවල ඉන්ධනහල් වල දෛනික වෙළදාමේ මුදල් නිතිපතා බැංකුගත කිරීම සිදු නොවන බවත්, අත ඉතිරි මුදල් වශයෙන් විශාල ලෙස මුදල් තබා ගන්නා බවත් නිරන්තරව මා වෙත වාර්තා වේ. මෙමඟින් සමුපකාර සමිති අනවශ්‍ය බැංකු අයිරා පවත්වා ගෙන යමින් අයිරා පොළී මුදලක් ගෙවූවද මෙම තත්ත්වය ගැන අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රමාණවත් සැලකිල්ලක් නොදක්වන බව දක්නට ලැබේ.

ඉන්ධනහල් වල වෙළදාම් මුදල් දිනකට දෙවතාවක්වත් බැංකුගත කිරීමටත්, නිවාඩු දිනවල දී මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර භාවිතා කරමින් මුදල් තැන්පත් කිරීමටත්, දිනයේ වෙළදාමේ සියලු මුදල් පසුදින පෙ.ව 9.00 වන විට බැංකුගත කළයුතු බවටත් කළමනාකරුවන්ට උපදෙස් ලබා දී එය නිසි පරිදි ක්‍රියාත්මක කරවීමට සාමාන්‍යාධිකාරිට හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිට (මූල්‍ය හා ගිණුම්) (විධායක නිලධාරීන්ට) පවරා අධ්‍යක්ෂක මණ්ඩලයේ නියාමනයට යටත්කල යුතු බව දන්වා සිටිමි.

දෛනික වෙළදාම් මුදල් දෛනිකව බැංකුගත කිරීම හෝ කාර්යාලයේ තැන්පත් කිරීම හා දිනයේ වෙළදාමේ සියලු මුදල් පසු දිනයේ පෙ.ව 9.00 ට පෙර එලෙස තැන්පත් කළ යුතු බවත් එලෙස නොකර අත ඉතිරි වශයෙන් නිරන්තරව මුදල් රඳවාගන්නා විට එම මුදලට බැංකු අයිරා පොළියට සමාන පොළී මුදලක් අයකරන බවත්, ඉන්ධනහල් කළමනාකරුවන්ගේ සේවා විභජන පත්‍ර වලට ඇතුළත් කරන ලෙසද එසේම මෙම කටයුතු අධීක්ෂණය කිරීමේ වගකීම දරන නියෝජ්‍ය සාමාන්‍යාධිනකාරි (වාණිජ/පාරිභෝගික), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය හා ගිණුම්) සහ සාමාන්‍යාධිකාරි යන අය වෙත ලිඛිතව වගකීම් පවරන ලෙසද, එම වගකීම් ඉටු නොකරන විටක ඔවුන්ට එරහිව පියවර ගැනීමට කටයුතු කරන ලෙස මෙයින් උපදෙස් දෙමි.

දිනයක වෙළදාම් වටිනාකම් හඳුනා ගැනීම සඳහා එක් එක් මනුවේ, දිනය ආරම්භයේ හා දිනය අවසානයේ පාඨාංකය උපයෝගි කර ගත යුතුය. සෑම දිනකම වෙළදාම හා මුදල් බැදීම් පරීක්ෂා කිරීමට සුදුසු ලේඛනයක් පවත්වාගෙන යාමට අවශ්‍ය පියවර ගනිමින්ද මෙම ලේඛනය පදනම් කර ගනිමින් වෙළදාම් මුදල් බැංකුගත කිරීම හෝ කාර්යාලයේ තැන්පත් කිරීම පිළිබඳව ඉන්ධනහලේ විෂය ලිපිකරු හා අභ්‍යන්තර විගණක මඟින් නිරන්තරව තොරතුරු ලබාගනිමින් නියාමනයට අධ්‍යක්ෂ මණ්ඩලය පියවර ගත යුතු වේ. එකී කාර්යය අධ්‍යක්ෂ මණ්ඩලය පැහැර හැරීම හේතුවෙන් ඉන්ධනහල් වල මුදල් අවභාවිතය හෝ වංචා කිරීම මඟින් සමිතියකට සිදු වන මූල්‍ය හානියකට අධ්‍යක්ෂ මණ්ඩලයද වගකිව යුතු බව වැඩි දුරටත් දන්වමි.

ජේ.ඒ.එස්.පී.ජයසිංහ,
සමුපකාර සංවර්ධන කොමසාරිස් හා,
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්,
ඌව පළාත.

පිටපත් - සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (බදුල්ල/ මොනරාගල)